# යුතුකම් හා වගකීම් පිළිබඳ බෞද්ධ මතය

## Buddhist view on duties and responsibilities

ඇතාකඩ ධම්මධජ හිමි

**සාරසංක්ෂේපය**

උසස් විද්‍යාත්මක හා තාක්ෂණික දැනුමින් සහ පුළුල් ලෙස දියුණු වූ අධ්‍යාපනික ක්‍රමවලින් ආභාසය ලද නූතන ලෝකයේ මිනිසුන් වෙන කවරදාටත් වඩා තම සදාචාරාත්මක වගකීම් හා යුතුකම්වලින් පලායන බවක් දක්නට තිබේ. මෙකී සමාජ සන්දර්භය තුළ මිනිසාගේ සදාචාරාත්මක වගකීම් ගැන ලිවීම නුසුදුසු දෙයක් නොවන අතර එමගින් මිනිසා තමා ගැනත් ඔහු ජීවත් වන සමාජය කෙරෙහි තමාගේ යුතුකම් හා වගකීම් ගැනත් සිතීමට යොමු කරයි. විශේෂයෙන් මෙම පර්යේෂණය ප්‍රධාන අරමුණු තුනක් සහිත ගුණාත්මක පර්යේෂණයකි. එනම්,

1. සාමාන්‍යයෙන් පුද්ගලයාගේ සමාජ භූමිකාවන්හි අර්ථය හා වැදගත්කම අධ්‍යයනය කිරීම.
2. බුදුදහමේ සමාජ භූමිකාවන්හි අර්ථය හා වැදගත්කම අධ්‍යයනය කිරීම.
3. සිගාලෝවාද සූත්‍රය පදනම් කරගත් පුද්ගලයාගේ බෞද්ධ සමාජ භූමිකාවන් ඉදිරිපත් කිරීම.

මෙම පර්යේෂණය මඟින් සිගාලෝවාද සූත්‍රය තුළ දැක්වෙන ආකාරයට පොදුවේ පුද්ගලයින්ගේ සමාජ භූමිකාවන්හි අර්ථය හා මානව සමාජයේ විවිධ මට්ටම්වල වැදගත්කමත් මනාව පෙන්නුම් කෙරේ. එපමණක් ද නොව සිගාලෝවාද සූත්‍රය පදනම් කරගත් පුද්ගල සමාජ භූමිකාවත්, පුද්ගලයා කෙරෙහි සමාජීය හා ආගමික බලපෑම් සහ සමාජ සුභසාධනය පිණිස වූ මැද

මාවත පිළිබඳවත් කරුණු ඉදිරිපත් කරන අතර අවසාන වශයෙන් මානව සමාජය තුළ බෞද්ධ සමාජ භූමිකාවන්හි ඇති වැදගත්කම ද පැහැදිලි කෙරේ. සමාජය තුළ පවතින විවිධාකාර වූ සමාජ භූමිකාවන් පුද්ගලයා කෙරෙහි බලපාන ආකාරය සිගාලෝවාද සූත්‍රානුසාරයෙන් පැහැදිලි කෙරේ.

**යතුරු පදඃ** පුද්ගල සමාජ භූමිකාව, බුද්දහම, මානව සමාජය, යුතුකම්, වගකීම්, සමාජ ගැටුම්

## Abstract

It is not an exaggeration to point out that in the modern world inspired by advanced scientific and technological knowledge and extensively developed education systems people are seems to be running off from their moral responsibilities never than before. In this context, it is not out of place to write on moral responsibilities of the man for it leads man to think about himself and his responsibilities to the society where he lives. Especially this research is a qualitative research that has three objectives. Namely:

1. To study meaning and significance of social roles of individuals in General,

2. To study the meaning and significance of social roles in the Buddhism,

3. To present the Buddhist social roles of individual based on Sigālovāda sutta.

The research shows the meaning of social roles in general, in Sigālovāda sutta and its significances on the different levels of human societies. Moreover, The Buddhist Social Roles of individuals based on Sigālovāda sutta, Social and religious Influences on human beings and the

Middle Path of Social welfare, are revealed in this research and finally, according to the Sigālovāda sutta, it is explained about the importance of Buddhist social roles in the human society. At the same time, it is also explained the types of social roles in human society and the effect of social roles to the individual based on Sigālovāda sutta.

**Keywords:** Individual Social Roles, Buddhism, Human Society, Duties, Respoìibilities, Social Conflicts

**හැඳින්වීම**

ලෝකය තුළ මිනිසාගේ යුතුකම් හා වගකීම් ප්‍රගුණ කරන්නේ කෙසේදැයි දැනගැනීමට එක් එක් පුද්ගල සමාජ භූමිකාවන් අධ්‍යයනය කිරීම වැදගත් වේ. බෞද්ධ ඉගැන්වීම් වලට අනුව සාර්ථක සමාජයක් තුළ සාමකාමී ජීවිතයක් ගතකිරීමට කැමති ජනතාවට වැදගත් වන බොහෝ සදාචාරාත්මක ඉගැන්වීම් ඇත. මේ සඳහා මිනිස් සමාජය තුළ පුද්ගල රාජකාරි හෝ වගකීම් වැනි දේ පිළිබඳව විමසිය හැකිය. ලෝකයේ මිනිසාගේ මානව අයිතිවාසිකම් සඳහා බුදු දහමේ පෙන්වාදෙන එක් එක් සමාජ භූමිකාවන් ප්‍රායෝගිකව ක්‍රියාත්මක කළ යුතු ආකාරය පෙන්වීම සඳහා මානව සමාජය තුළ පුද්ගල යුතුකම් හා වගකීම්වල ප්‍රායෝගික ක්‍රියාකාරිත්වයේ ඇති වැදගත්කම අවධාරණය කෙරේ.

සිගාලෝවාද සූත්‍රය ගිහි සදාචාරය සහ සමාජ වගකීම් පිළිබඳව ඉතා වැදගත් සූත්‍රයක් වන අතර මෙහිදී බෞද්ධ දෘෂ්ටිකෝණයට අනුව ගිහියෙකුගේ ගෘහස්ථ හා සමාජ යුතුකම් පිළිබඳව අවධාරණය කොට තිබේ. පසුකාලීනව බෞද්ධයින් විසින් මෙය හඳුන්වනු ලබන්නේ ‘ගිහි විනය’ ලෙසය. මෙම සූත්‍රයට අනුව බුදු දහමේ උගන්වන සමාජ භූමිකාව යනු සාමාජීය ගැටුම් නිරාකරණයට සහ සාර්ථකව තම ජීවිතය ගත කරන ආකාරය හඳුනා ගැනීමට ඇති ප්‍රායෝගික ක්‍රමයකි. කෙසේ වෙතත් සිගාලෝවාද සූත්‍රය යනු බුදුරජාණන් වහන්සේ සිගාල ගෘහපතියාට දේශනා කළ දිශාවන් හය පිළිබදව උපදේශයයි.

තනි පුද්ගලයින්ගේ හෝ සමාජ කණ්ඩායම්වල ක්‍රියාකාරිත්වය සඳහා ඉවහල් වන ඔවුන්ගේ හැකියාවන් දියුණු කිරීමට හෝ එකී අරමුණට හිතකර සමාජ නිර්ණායකයන් නිර්මාණය කිරීමට යොමු වීම සමාජ භූමාකාවන් ලෙස හැඳින්විය හැකිය. බුදුන් වහන්සේගේ ඉගැන්වීමවලට අනුව සමාජය ලෙස හැදින්වෙන්නේ සමාජ කාර්යයන්ය. එනම්, ඒ ඒ සමාජ කණ්ඩායම්වල පුද්ගලයින් සඳහා සිදු කරන පරිත්‍යාග කිරීම, ආර්ථිකය, අධ්‍යාපනය හා සංස්කෘතික ක්‍රියාකාරකම්ය. බුදු දහමට අනුව සමාජ භූමිකාවන් යනු පුද්ගලයෙකුගේ තරාතිරම අනුව අපේක්ෂා කළ හැකි සංකීර්ණ සමාජ ක්‍රියාවන් ලෙස තේරුම්ගත හැකිය. එසේම ඇතැම් සමාජ හැසිරීම් රටාවන් චාරිත්ත සීල වාරිත්ත සීල යටතේ විස්තර කොට දක්වා ඇත්තේ එහෙයිනි. එපමණක් ද නොව පුද්ගලයාට යහපත් වීමටත්, තම යුතුකම් අකුරටම ඉටු කිරීමටත් හා අයහපත් ක්‍රියාවන්ගෙන් වැළකීම සඳහා පුරුදු පුහුණු කළ හැකි බොහෝ ප්‍රායෝගික ක්‍රම ද සිගාලෝවාද සූත්‍රයේ දී පෙන්වා දී තිබේ. මෙම චාරිත්ත සීල හා වාරිත්ත සීල සම්බන්ධයෙන් ගත් කල එය දියුණුවත් සමග සාමකාමී ලෝකයක් නිර්මාණය කිරීම සඳහා අතිශයින් වැදගත් වන්නේ ඒ තුළ පුද්ගලයාගේ වගකීම් හා යුතුකම් දැඩිව අවධාරණය වන නිසාය.

**පර්යේෂණ ගැටලුව**

බෞද්ධ ඉගැන්වීම්වලට අනුව සාර්ථක සමාජයක් තුළ සාමකාමී ජීවිතයක් ගතකිරීම සඳහා අවශ්‍ය සදාචාර ධර්ම කොටසක් ලෙස සැලකෙන යුතුකම් හා අයිතිවාසිකම් පිළිබඳව බුදු දහමේ දක්වා ඇති මතය කුමක්ද යන්න මෙහි පර්යේෂණ ගැටලුව ලෙස යොදාගනු ලැබේ.

**පර්යේෂණ අරමුණු**

විශේෂයෙන් මෙම පර්යේෂණය ප්‍රධාන අරමුණු තුනක් සහිත ගුණාත්මක පර්යේෂණයකි. එනම්,

1. සාමාන්‍යයෙන් පුද්ගලයාගේ සමාජ භූමිකාවන්හි අර්ථය හා වැදගත්කම අධ්‍යයනය කිරීම

2. බුදුදහමේ සමාජ භූමිකාවන්හි අර්ථය හා වැදගත්කම අධ්‍යයනය කිරීම

3. සිගාලෝවාද සූත්‍රය පදනම් කරගත් පුද්ගලයාගේ බෞද්ධ සමාජ භූමිකාවන් ඉදිරිපත් කිරීම

**පර්යේෂණයේ වැදගත්කම**

දිනෙන් දින විද්‍යාත්මකව හා තාක්ෂණික වශයෙන් දියුණුවන ලෝකයක තමා වටා ඇති සමාජයේ භෞතික සංවර්ධනය වෙනුවෙන් කැපවීමට මිනිසාට සිදු වී තිබේ. නව තාක්ෂණික දැනුම මගින් සියල්ල ආක්‍රමණය කොට ඇති නූතන ලෝකයේ මිනිසුන් වෙන කවරදාටත් වඩා තම සදාචාරාත්මක වගකීම් හා යුතුකම් මගින් පලායන බවක් වර්තමානයේදී දක්නට තිබේ. එහි අනිටු විපාක සමාජය තුළම අපට කොතෙකුත් දැකගත හැකිය. මෙම ස්වභාවයන් මගහරවා ගැනීම සඳහා සෑම පුද්ගලයෙකුටම තමා ගැනත්, තමා ජීවත්වන සමාජය කෙරෙහි ඉටුවිය යුතු යුතුකම් හා වගකීම් ගැන සිතීමට යොමුකරවීමත්, පුද්ගල සමාජ භූමිකාවන්හි අර්ථය හා වැදගත්කම පැහැදිලි කිරීමත් මෙන්ම යුතුකම් හා වගකීම් ඉටුවන සදාචාරාත්මක සමාජයක් සඳහා බෞද්ධ ඉගැන්වීම්වල උපයෝගීතාව ඉස්මතු කොට දැක්වීමත් මෙම පර්යේෂණයේ වැදගත්කම ලෙස දැක්විය හැකිය.

**සාහිත්‍ය විමර්ශනය**

- දීඝ නිකාය III, පාථික වග්ගපාලි, සිගාලක සූත්‍රය

මෙහිදී බෞද්ධ දෘෂ්ටිකෝණයට අනුව ගිහියෙකුගේ ගෘහස්ථ හා සමාජ යුතුකම් පිළිබඳව අවධාරණය කොට තිබේ. මෙම සූත්‍රයට අනුව බුදුදහමේ උගන්වන සමාජ භූමිකාව යනු සාමාජීය ගැටුම් නිරාකරණයට සහ සාර්ථකව තම ජීවිතය ගත කරන ආකාරය හඳුනා ගැනීමට ඇති ප්‍රායෝගික ක්‍රමයකි. මෙම සිගාලෝවාද සූත්‍රය තුළ බුදුරජාණන් වහන්සේ සිගාල ගෘහපතියාට දේශනා කළ දිශා හය පිළිබඳව උපදේශය ඇතුළත්ය.

- මජ්ඣිමනිකාය III, බාල පණ්ඩිත සූත්‍රය

චාරිත්ත සීලයක් ලෙස හැඳින්වෙන පංචශීල ප්‍රතිපදාව ආරක්ෂා නොකිරීම නිසා ඇතිවන සමාජ බලපෑම විස්තර කෙරේ. බාලයින් හෙවත් මෝඩ පුද්ගලයින් ඇසුරු නොකළ යුතු බව මෙම සූත්‍රයේදී පෙන්වා දී තිබේ. මෝඩකම යනු කර්මය හා කර්ම ඵලය විශ්වාස නොකිරීමය. එවැනි බාලයින්ගේ කායික, වාචසික හා මානසික ක්‍රියාවන් අන්‍යයන්ට හානිකර බව මෙම සූත්‍රයේ දී විස්තර කොට තිබේ.

- ජාතක පොත් වහන්සේ, කුරු ධර්ම ජාතකය

පංචකාමයන්හි වරදවා හැසිරීම පංචශීලයෙහි තෙවැනි ශික්ෂා පදය කඩ කිරීමකි. සියලු සත්ත්වයන් සැප විදීමට කැමතිය. එහෙත් ආචාරශීලී සමාජ සම්මතයන්ට විරුද්ධව පසිඳුරන් පිනවීමට ඉඩ ප්‍රස්ථාව බුදු සමයෙන් නොලැබෙන බවත්, ධාර්මිකව ඉන්ද්‍රියන් පිනවීමේ අවස්ථාව බුදු දහමින් ලබාදී ඇති බවත් මෙහිදී පැහැදිලි කෙරේ

- සුත්තනිපාතය, පරාභව සූත්‍රය

යමෙක් තමාට ශක්තිය හා හැකියාව තිබියදී දෙමාපියන්ට නොසලකා හරින්නේ නම් එය එම පුද්ගලයාගේ පිරිහීමට කරුණක් බව දක්වා තිබේ.

- සුත්තනිපාතය, මංගල සූත්‍රය

තම මව්පියන් වෙනුවෙන් යුතුකම් ඉටු කිරීම ද, අඹු දරුවන්ට සංග්‍රහ කිරීම ද, ඥාති පරිවාරයට හා තම හිත මිතුරන් වෙනුවෙන් කළ යුතු යුතුකම් ඉටු කිරීම ද උතුම් මංගල කරුණු බවත්, එය සාමකාමී ගුණගරුක සමාජයක් නිර්මාණය කිරීමෙහිලා අතිශයින් උපකාරී වන බවත් සඳහන් වේ.

- ඛුද්දකනිකාය , ධම්මපද දණ්ඩ වග්ගය

සියලු සත්ත්වයන් දඬුවමට හා මරණයට බිය බවත්, තමා උපමා කොට වාරිත්ත සීලයක් ලෙස ප්‍රාණඝාතාදියෙන් වැළකී සිටීම තුළින් සියලු සත්ත්වයින්ගේ ජීවත්වීමේ අයිතිය සුරක්ෂිත වන බවත් පැහැදිලි කෙරේ.

- වෙසක් හඬ, වාර්ෂික ධර්ම සංග්‍රහය

සාමකාමී සදාචාර සම්පන්න සමාජයක් සඳහා අන්‍යෝන්‍ය යුතුකම් ඉටු කිරීමේ අවශ්‍යතාවත්, ඉන් පසුව තම අයිතිවාසිකම් නිදහසේ භුක්ති විඳීමේ අයිතියත් මෙහිදී පැහැදිලි කොට තිබේ.

- ගිරිහිස, ජ්‍යෙෂ්ඨ මහාචාර්ය, අතිපූජ්‍ය කන්දේගොඩ විමලධම්ම අනුනාහිමි සේවාභිනන්දන ශාස්ත්‍රීය සංග්‍රහය

සදිසා වන්දනයේ සමාජ භාවිතය හා ඒ සඳහා බුදු දහමේ ඉගැන්වෙන යුතුකම් හා අයිතිවාසිකම්වල ඇති සමාජ වටිනාකමත් දක්වා තිබේ.

**පර්යේෂණ ක්‍රමවේදය**

මෙම පර්යේෂණය දාර්ශනික ප්‍රවේශයකි. ඓතිහාසික මූලාශ්‍රයගත තොරතුරු හා නූතන දෙස් විදෙස් වියතුන්ගේ ලිපි ලේඛන ආශ්‍රයෙන් කෙරෙන දාර්ශනික විචාරයකි. එබැවින් මෙහිදී භාවිත කරනුයේ ග්‍රන්ථ සඬාර ක්‍රමවේදයයි. එසේම මෙය ගුණාත්මක පර්යේෂණයක් වන අතරම විස්තරාත්මක ද වේ. ඒ අනුව මෙම අධ්‍යයනය තුළදී ප්‍රාථමික හා ද්විතීයික මූලාශ්‍රය යොදාගනු ලැබේ. එසේම බෞද්ධ සමාජ දර්ශනයට අදාළව රචිත ශාස්ත්‍රීය ලිපි, ග්‍රන්ථ ආදිය ද භාවිතයට ගන්නා ලදි. මෙහිදී විචාරාත්මක ක්‍රමය හරහා විස්තරාත්මකව රැස්කරණු ලැබූ දත්ත විශ්ලේෂණයට බඳුන් කරනු ලැබේ.

## සාකච්ඡාව

සමාජ ස්ථර, සමාජ තත්ත්වය හා සමාජ භූමිකාව පිළිබඳව අදාළ සංකල්ප නිර්වචනය කිරීමේදී සමාජ විද්‍යාඥයින් අතර සැලකිය යුතු මට්ටමේ එකඟ නොවීම් පවතින බව පැහැදිලි කරුණකි. කරුණු එසේ වූවත්, මෙම සංකල්පය පිළිබඳව මෙන්ම පුද්ගල යුතුකම හා අයිතිවාසිකම් පිළිබඳවත් බුදු දහමේ දැක්වෙන්නේ එකම ආකල්පයකි. මෙම සංකල්පයන් යටතේ සමාජ භූමිකාව ලෙස සරලව හැඳින්වෙන්නේ සමාජයේ සාමූහික සදාචාරය, පවුල්වලට ප්‍රතිචාර දැක්වීම, සමාජ සුභසාධනයේදී මධ්‍යස්ථ ආකල්පය සහ සමාජීය ආගමික බලපෑමය. බුදු දහමේ මෙම සමාජ භූමිකාවන් ආචාර ධර්ම වර්ග දෙකක් යටතේ දක්වා ඇත. එනම් පංචසීලය හා ආර්ය අෂ්ටාංගික මාර්ගයයි. මෙසේ සීලය යටතේ විස්තර කෙරෙන සමාජ භූමිකාවන් නැවත කොටස් දෙකකට වර්ගීකරණය කළ හැකිය.

## චාරිත්ත සීල

චාරිත්ත සීල යනු මානව සමාජයේ පුද්ගලයාගේ යුතුකම් හා වගකීම්වල පුරුදු පුහුණු වීම පිළිබඳව හෙවත් කළ යුතු දේ පිළිබඳ වූ විග්‍රහයයි. තවත් ආකාරයකින් පවසන්නේ නම් චාරිත්ත සීලය යනු යම් යම් ආකාරයේ සදාචාරවත් වගකීම් ඉටුකළ යුතු බවයි. බෞද්ධ සදාචාරය තුළ යම් යම් ආකාරයේ සදාචාරාත්මක බැඳීම් හා වගකීම් ගොඩනැගෙන්නේ ඒ අනුවය. භික්ෂූන් වහන්සේලාට, ගුරුවරුන්ට, දෙමව්පියන්ට, සහ වැඩිහිටියන්ට පුද සත්කාර කිරීම, කීකරු වීම හා එකිනෙකා කෙරෙහි ගෞරව පූර්වකව හැසිරීම ඒ අතර වෙයි. බුදුදහමට අනුව සෑම බෞද්ධ ගිහියෙක්ම මෙම හැසිරීමට අනුගත විය යුතුය. එසේම දෙමව්පිය - දූ-දරු, ගුරු - සිසු, ස්වාමි - සේවක, ගිහි - පැවිදි, ස්වාමි - භාර්යා හා හිත මිතුරන් ආදී සමාජ කණ්ඩායම් වෙනුවෙන් තම යුතුකම් ඉටු කිරීම මෙම චාරිත්ත සීලය ලෙස හැඳින්විය හැකිය. මෙය පදනම් විය යුත්තේ සිගාලෝවාද සූත්‍රයේ දැක්වෙන දිශා හයකට අදාළ බෞද්ධ සංස්කෘතික ක්‍රියාකාරකම් මතය. කෙසේ වෙතත් මෙමගින් මානව

සමාජය සඳහා විවිධාකාර වූ පුද්ගල යුතුකම් හා වගකීම් රාශියක් අපට හඳුනාගත හැකිය. යමෙකුට මානව අයිතිවාසිකම්වල සමාජ භූමිකාවන් සමග සමාජ ආචාරධර්ම පුරුදු කළ යුතු නම්, අකුසල ක්‍රියාවන්ගෙන් ඈත්ව ශ්‍රද්ධාව හා වීර්යය දියුණු කරගත යුතුය. මෙහිදී ශ්‍රද්ධාව යන්නෙන් අදහස් කරනුයේ චාරිත්ත සීලය පුරුදු කරන තැනැත්තාට එය යහපත් පුරුද්දක් වන බැවින් එහි ප්‍රතිලාභ ඔහු භුක්ති විඳිනු ඇතැයි විශ්වාස කිරීමය. වීර්යය යනු අලසකමින් මිදීමට දැඩි උත්සාහයක් දැරීම සහ සදාචාරාත්මක හැසිරීම් ඉවසීමෙන් යුතුව පවත්වා ගැනීමයි. මෙසේ යම් පුද්ගලයෙකුට ශ්‍රද්ධාවෙන් හා වීර්යයෙන් යුතුව සදාචාරාත්මක හැසිරීම් පුරුදු පුහුණු කළ හැකි නම් පමණක් ඔහු චාරිත්ත සීලයෙන් යුතු අයෙකු ලෙස හැඳින්විය හැකිය.

### චාරිත්ත සීල

චාරිත්ත සීල යනු සාමකාමී සමාජයක පුද්ගලයාගේ යුතුකම් හා වගකීම් පිළිබඳ වැරදි අදහස් හා ක්‍රියාවන්ගෙන් වැළකීමය. තවත් ආකාරයකින් පවසන්නේ නම් චාරිත්ත සීලය යනු බුදුරජාණන් වහන්සේ විසින් තහනම් කළ සදාචාර විරෝධී හැසිරීම් හෝ අකුසල කර්මයන්ගෙන් වැළකී කටයුතු කිරීමය. මෙහි මූලික පදනම ගොඩනැගෙන්නේ පංචසීල ප්‍රතිපදාව තුළිනි. මෙය සමාජීය භූමිකාවන්ගෙන් එකක් වන අතර එය ලෝකයේ මානව අයිතිවාසිකම් පිළිබඳව පුද්ගල යුතුකම් හා වගකීම් ඉටුවීමේදී සිදුවන ඇතැම් සදාචාර විරෝධී ක්‍රියාවන්ගෙන් ඈත්වීම සඳහා මානව සමාජයට අත්‍යවශ්‍යම සාරධර්ම පහකි. යමෙක් අන් අයගේ ප්‍රාණය තම ප්‍රාණයට සමානව සිතන්නේ නම් හෝ සමාජ ගැටුම් ඇතිවිය හැකි සොරකම, කාමමිථ්‍යාචාරය, බොරුව හා සුරාවට ලොල් වීම ආදී දුරාචාරයන්ගෙන් ඈත් වී ජීවත් වන්නේ නම් සුරක්ෂිත හා සදාචාරවත් සමාජයක් ගොඩනැගෙන්නේ එවිටය.

මෙම බෞද්ධ සදාචාර ප්‍රතිපත්ති පිළිපැදීම කෙනෙකුගේ පෞද්ගලික හා සමාජීය ජීවිතයට බෙහෙවින් බලපායි. දෙවියන් වහන්සේ හෝ වෙනත් සර්ව බලධාරී පුද්ගලයෙකු විසින් හිතාමතා

පනවන ලද ආඥා මාලාවකට වඩා යමෙකු තම කැමැත්තෙන්ම භාරගන්නා යම් සදාචාර ධර්මයන් හෝ වාරණයන් වේ නම් එය කෙනෙකුගේ හෘදය සාක්ෂ්‍යයට හා සමාජ දැනුවත්භාවය කෙරෙහි ධනාත්මක බලපෑමක් ඇති කරනු ඇත. මෙම වාරණයන් හෙවත් පංචසීල ප්‍රතිපදාව කෙනෙකුගේ පෞද්ගලික මට්ටමින් සදාචාරාත්මක ජීවිතයක් ගත කිරීමටත්, ආධ්‍යාත්මික ජීවිතයේ ඉදිරියට ගමන් කිරීමටත් බෙහෙවින් උපකාරී වේ. එපමණක් ද නොව මෙම සදාචාරවත් චර්යාව තුළින් කෙනෙකුට මෙලොව ජීවිතයේ යහපත පිණිස උපකාරී වන කුසල් රැස්කර ගැනීමටත්, පරලොව ජීවිතයේ සතුට හා සමෘද්ධිය සහතික කරගැනීමටත් අවස්ථාව උදාවෙයි. සමාජීය මට්ටමේදී පංචසීලයේ ඇති වැදගත්කම නම් එමගින් සමාජය තුළ සාමය, සහජීවනය හා අන්‍යොන්‍ය විශ්වාසය ගොඩනැගීමයි.

අන්‍යොන්‍ය ගෞරවය යනු ඉතා වැදගත් සමාජ ආචාර ධර්මයකි. පුද්ගල සම්බන්ධතාවයකදී හෝ පවුල් පරිසරයක් තුළ දී එකිනෙකා කෙරෙහි ගෞරවයක් නොමැති නම් සාමයේ සහ විශ්වාසයේ හැඟීම් ඔවුන් තුළ ගොඩ නොනැගෙනු ඇත. බුදුන් වහන්සේ විසින් සිගාල ගෘහපතියාට දේශනා කරන ලද්දේ සදිසා නමස්කාරය යන්නෙන් අදහස් කරන්නේ සමාජ සම්බන්ධතා හයක එකිනෙකාගේ යුතුකම් හා වගකීම් ඉටුකිරීම යන්නයි. සිගාල ගෘහපතියාගේ මෙම සදිසා වන්දනයට බුදුන් වහන්සේ විසින් සදාචාරාත්මක මුහුණුවරක් ලබා දෙමින් ඒ ඒ සමාජ කණ්ඩායම් දිශාවන්ට අනුව වර්ග කර දැක්වූ ආකාරය සිගාලෝවාද සූත්‍රයෙහිදී පැහැදිලිව දක්වා තිබේ.

01. පුරත්ථිමා දිසා මාතා පිතරෝ වේදිතබ්බා

නැගෙනහිර දිශාව - මව්පියන්

02. දක්ඛිණා දිසා ආචරියා වේදිතබ්බා

දකුණු දිශාව - ගුරුවරු

03. පච්ඡිමා දිසා පුත්තදාරා වේදිතබ්බා

බස්නාහිර දිශාව - අඹුදරුවෝ

04. උත්තරා දිසා මිත්තාමච්චා වේදිතබ්බා

උතුරු දිශාව - මිත්‍ර කුල පුත්‍රයෝ

05. හෙට්ඨිමා දිසා දාසකම්මකාරා වේදිතබ්බා

යට දිශාව - දාස දැසි දැස් කම්කරුවන්

06. උපරිමා දිසා සමණබ්‍රාහ්මණා වේදිතබ්බා

උඩ දිශාව - මහණ බමුණන්

''මාතා පිතා දිසා පුබ්බා - ආචරියා දක්ඛිණා දිසා
පුත්තදාරා දිසා පච්ඡා - මිත්තාමච්චා ච උත්තරා
දාසකම්මකරා හෙට්ඨා - උද්ධං සමණ බ්‍රාහ්මණා
ඒතා දිසා නමස්සෙයිය - අලමත්තෝ කුලේගිහී ''

දරුවන්ගේ ජීවිත ආලෝකවත් කරන්නේ දෙමව්පියන්ය. මව් කුසක දරුවකු පිළිසිඳගත් දා සිට මෙලොවට බිහි කරන තෙක් සහ එතැන් සිට දරුවා ලොකු මහත් කොට පෝෂණය කරමින් ගුණ නුවණ ලබාදෙමින් සමාජයට ප්‍රයෝජනවත් පුද්ගලයෙකු බවට පත් කිරීම සඳහා දෙමව්පියෝ අප්‍රමාණ වෙහෙසක් දරති. දෙමව්පියන් යනු දරුවන්ගේ පූර්වාචාරවරුන් මෙන්ම දරුවන්ගේ සියලුම ආකාරයේ ගරු සැලකිලි හා පුද සත්කාර ලැබීමටද සුදුස්සන්ය. දෙමව්පියන් පෝෂණය කරමින් රැක බලා ගැනීම දෙලොව යහපත සැලසෙන මංගල කරුණකි. එසේම යමෙක් තමාට හැකියාව තිබියදී දෙමව්පියන් පෝෂණය නොකරන්නේ නම් එය පිරිහීමට හේතුවන කරුණක් ලෙසත් දක්වා ඇත. මෙම කරුණු පිළිබඳව අවධානය යොමු කරමින් බුදුන් වහන්සේ

දරුවන්ගේ මෙන්ම දෙමව්පියන්ගේ ද යුතුකම් හා අයිතිවාසිකම් පිළිබඳව දේශනා කළහ. දරුවන් තම දෙමව්පියන් කෙරෙහි මෙලෙසින් උපස්ථාන කළ යුතුය.

01. මහලු දෙමව්පියන් පෝෂණය කිරීම

02. දෙමව්පියන්ගේ කටයුතු ඉටුකර දීම

03. දෙමව්පියන්ගේ කුල පරම්පරාව ආරක්ෂා කිරීම

04. දෙමව්පියන්ගෙන් උරුම වූ දායාද ආරක්ෂා කිරීම

05. මියගිය දෙමව්පියන් සිහිපත් කොට පිං පැමිණවීම

මේවා දෙමව්පියන්ගේ අයිතිවාසිකම් ලෙසද අර්ථ දැක්විය හැකිය. මෙම අයිතිවාසිකම් අපේක්ෂා කරන දෙමව්පියන් තම දූ දරුවන් කෙරෙහි මෙසේ අනුකම්පා කළ යුතුය.

01. තම දරුවන් පවින් වළක්වා ගැනීම

02. තම දරුවන් යහපතෙහි යෙදවීම

03. ශිල්ප ශාස්ත්‍ර ඉගැන්වීම

04. සුදුසු කල අවාහ විවාහ කර දීම

05. සුදුසු කල දායාද පවරා දීම

මේවා දූදරුවන්ගේ අයිතිවාසිකම්ය. මෙලෙසින් දෙමව්පියන් හා දූදරුවන් අතර අන්‍යොන්‍ය වශයෙන් යුතුකම් හා අයිතිවාසිකම් ඉටුවන විට එය සාමකාමී ගෘහස්ථ ජීවිතයකට මෙන්ම සදාචාරවත් සමාජයක් සඳහා ද මග පාදන කරුණක් වෙයි.

පුද්ගල ජීවිතවල සුවපත්භාවය සඳහා ප්‍රබල ලෙස බලපෑම් කරන සමාජ කණ්ඩායමක් ලෙස ගුරුවරු පෙන්වාදිය හැකිය. බුදුරජාණන් වහන්සේ භික්ෂූන් වහන්සේලාට අවවාද කළේ

ගුරුවරයා කෙරෙහි පිය සෙනෙහසින් කටයුතු කළ යුතු බවයි. එසේම ගුරුවරයාද තම ශිෂ්‍යයින් කෙරෙහි දරු සෙනෙහසින් ක්‍රියා කළ යුතු බව පෙන්වා දෙයි. සැබෑ ගුරුවරයාගේ කාර්යභාරය දැනුම ලබා දීම පමණක් ම නොවන බව සිගාලෝවාද සූත්‍රයේ දී පෙන්වා දෙන ගුරු සිසු යුතුකම් කොටස් හඳුනා ගැනීමෙන් පැහැදිලි කරගත හැකිය. ශිෂ්‍යයා තම ගුරුවරයා වෙනුවෙන් මෙසේ කටයුතු කළ යුතුය.

01. ගුරුවරයා දැක අසුනෙන් නැගී සිටීමෙන්

02. ගුරුවරයාට උපස්ථාන කිරීමෙන්

03. උගන්වන දේ හොඳින් අසා සිටීමෙන්

04. ගුරුවරයාගේ වතාවත් කිරීමෙන්

05. උගන්වන ශිල්පය හොඳින් පිළිපැදීමෙන්

එසේම ගුරුවරයාද තම ශිෂ්‍යයන් කෙරෙහි මෙසේ පිළිපැදිය යුතුය.

01. තම ශිෂ්‍යයා මනා කොට හික්මවීමෙන්

02. තම ශිෂ්‍යයාට මනාකොට ඉගැන්වීමෙන්

03. තමා දත් සියලු ශිල්ප ශිෂ්‍යයාට ඉගැන්වීමෙන්

04. තම හිත මිතුරන්ට ශිෂ්‍යයා හඳුන්වා දීමෙන්

05. තම ශිෂ්‍යයාගේ ආරක්ෂාව සලසා දීමෙන්

ආදර්ශවත් ගෘහජීවිතයක් යනු අඹුසැමියන් දෙපලම අන්‍යොන්‍ය වශයෙන් එකිනෙකා අවබෝධ කොටගෙන සාමකාමීව ගත කරන ජීවිතයයි. සමාජ සංස්ථා අතර කුඩාම ඒකකය වන්නේ පවුල් සංස්ථාවයි. එය වඩාත් අර්ථසම්පන්න වන තරමට මහ සමාජයද අර්ථ සම්පන්න බවින් යුක්ත වේ. බුද්ධ දේශනයට අනුව

ස්වාමියා හා බිරිඳ දෙවියෙක් සහ දෙවඟනක් මෙන් කටයුතු කළ යුතුය. ඒ සඳහා අවශ්‍ය ධර්ම උපදේශනය සිගාලෝවාද සූත්‍රයේ දී පෙන්වා දී තිබේ. ඒ අනුව ස්වාමියා තම බිරිඳ වෙනුවෙන් මෙසේ යුතුකම් ඉටුකළ යුතුය.

01. යහපත් වචන කතාකිරීමෙන්

02. අයහපත් වචන කතා නොකිරීමෙන්

03. පර අඹුවන් කරා නොයෑමෙන්

04. ගෙදර කටයුතු වල අධිපති බව ඇයට පැවරීමෙන්

05. තමාට ශක්ති ප්‍රමාණයෙන් ඇඳුම් පැළඳුම් සපයා දීමෙන්

ස්වාමියා මෙසේ කටයුතු කරන විට බිරිඳ තම සැමියා පති දෙවියෙකු ලෙස සලකා කටයුතු කළ යුතු බව ද එම සූත්‍රයේම සඳහන් කොට ඇත.

01. නිවසේ කටයුතු මනාව සංවිධානය කිරීමෙන්

02. සැමියාගේ නෑ හිත මිතුරන්ට සංග්‍රහ කිරීමෙන්

03. සැමියා හැර අන් අයෙකු නොපැතීමෙන්

04. සැමියා උපයන ධනය ආරක්ෂා කිරීමෙන්

05. සියලු කටයුත්තෙහි දක්ෂව හා අනලස්ව කටයුතු කිරීමෙන්

මෙසේ අන්‍යෝන්‍ය වශයෙන් එකිනෙකා මනාව හඳුනාගෙන තම තමාගේ යුතුකම් ඉටුකරමින් කටයුතු කරන විට එම පවුල් සංස්ථාව සාමකාමී ආදර්ශවත් එකක් වනු ඇත. එය සමස්ත සමාජයේම යහපත උදෙසා ඉවහල් වනු ඇත.

පුද්ගලයෙකුගේ ජීවිතයේ සාර්ථකභාවය පිණිස බලපාන කාරණා අතර ඔහුගේ මිත්‍ර පරිවාරයද විශේෂයෙන් පෙන්වාදිය හැකිය. මෙහිදී මිතුරන් ලෙස හඳුනවන්නේ තමාගේ දියුණුව ප්‍රාර්ථනා කරමින් අවශ්‍ය මොහොතේ දී අවවාද හා මග පෙන්වීම් කරන කල්‍යාණ මිත්‍රයින්ටය. එවැනි මිතුරන් උදෙසා තම යුතුකම ඉටුකළ යුත්තේ,

01. දානයෙන්

02. ප්‍රිය වචනයෙන්

03. අර්ථචර්යාවෙන්

04. සමානාත්මතාවෙ න් හා

05. නොරැවටීමෙන් ය.

මෙසේ කටයුතු කරන තම මිතුරා වෙනුවෙන් කරුණු පහකින් නැවත අනුකම්පා කළ යුතුය.

01. රහමෙරින් මත් වූ තම මිතුරා රැකගනියි

02. ඔහුගේ ධනය රැක දෙයි

03. උවදුරකට පත් තම මිත්‍රයාට පිහිට වෙයි

04. විපත් පැමිණි කල තම මිතුරා අත් නොහරී

05. තම මිතුරාගේ දරු මුණුපුරන්ට තමාගේ සේ සලකයි

මෙසේ මිතුරු කණ්ඩායම් අතර අන්‍යොන්‍ය වශයෙන් යුතුකම් ඉටුකර ගැනීම නිසා මිත්‍රත්වය තව තවත් ශක්තිමත් වනවා සේම එවැනි කණ්ඩායම් සමාජයේ යුක්තිය හා සාධාරාණත්වය ඉටු කිරීම සඳහා නිතර දායක වෙයි.

සමෘද්ධිමත් හා සාධාරණ සමාජයක් සඳහා ස්වාමි සේවක අන්‍යොන්‍ය සුහදතාවය ඉතා වැදගත්ය. යම් කර්මාන්තයක

දියුණුව සඳහා සවාමි සේවක දෙපාර්ශවයේම ශක්තීන් අත්‍යාවශ්‍ය සාධකයකි. මෙය වර්තමාන සමාජයටද ඉතා වටිනා උපදේශයකි. සෑම සේවකයෙකුම තම වරප්‍රසාද අපේක්ෂා කළ යුත්තේ තමා වෙත පැවරුණු රාජකාරිය අවංකව ඉටුකිරීමෙන් පසුවය. එසේම ස්වාමියාද සේවකයින්ගේ හැකියාවන් අනුව රාජකාරී පැවරීම හා ඒ සඳහා අවශ්‍ය වේතනයන් ගෙවීමට අවශ්‍ය කටයුතු සුදුසු වෙලාවෙදී සිදු කළ යුතුය. බුදුන් වහන්සේ සිගාලකට දුන් අවවාදයන්ට අනුව ස්වාමියා තම සේවකයන් කෙරෙහි මෙසේ පිළිපැදිය යුතුය.

01. සේවකයින්ගේ හැකියාවන් අනුව කටයුතු පැවරිය යුතුය

02. නියමිත පරිදි ආහාර හා වැටුප් ලබා දිය යුතුයි

03. ගිලන් වූ පසු නිසි ඇප උපස්ථාන හා ප්‍රතිකාර ලබා දිය යුතුය

04. විශේෂ ආහාරපාන ආදියක් වේ නම් සියල්ලන්ටම බෙදා දිය යුතුය

05. සුදුසු කාලයේදී විශ්‍රාම ගැන්වීම කළ යුතුය

මෙසේ කටයුතු කරන විට සේවකයින් ද ස්වාමියා කෙරෙහි මෙසේ පිළිපැදිය යුතුය.

01. ස්වාමියාට ප්‍රථම අවධි වීම

02. ස්වාමියාට පසුව නින්දට යාම

03. ස්වාමියා දුන්දෙය පමණක් ගැනීම

04. තමා වෙත පැවරුණු කාර්යය මනාව ඉටුකිරීම

05. තම ස්වාමියාගේ ගුණ වර්ණනා කිරීම

එසේම ඕනෑම සමාජයක ආචාරශීලී පැවැත්ම පෝෂණය කරන්නේ ආගමික ඉගැනවීමෙනි. එම ආගමික ඉගැන්වීම් සමාජයට ඉදිරිපත් කරන්නේ ලෞකික අපේක්ෂාවන් දුරුකොට පරාර්ථය වෙනුවෙන් කැප වූ පූජ්‍ය, පූජක කණ්ඩායම්ය. එබැවින් මෙම ගිහි පැවිදි දෙපිරිස අතර අන්‍යොන්‍ය විශ්වාසය ඇතිකරලීම සඳහා අවශ්‍ය මඟ පෙන්වීම මෙම සූත්‍රයේ අන්තර්ගතය. පංචකාමයන්ගෙන් බැහැරව පරාර්ථය සඳහා ක්‍රියාත්මක වන එම පිරිස වෙනුවෙන් ගිහි ශ්‍රාවකයින් කරුණු පහකින් සංග්‍රහ කළ යුතුය. එනම්,

01. මෛත්‍රී සහගත කාය කර්මයෙන්

02. මෛත්‍රී සහගත වචී කර්මයෙන්

03. මෛත්‍රී සහගත මනෝ කර්මයෙන්

04. තමාගේ නිවස උන්වහන්සේලා සඳහා විවෘතව තැබීමෙන්

05. සිවුපසයෙන් උපස්ථාන කිරීමෙන්

මෙසේ යුතුකම් සලකන තම ගිහි ශ්‍රාවකයින් වෙනුවෙන් පැවිද්දා කරුණු හයකින් සංග්‍රහ කරයි.

01. පවින් වැළැක්වීම

02. යහපතෙහි යෙදවීම

03. අනුකම්පා සිතින් ක්‍රියා කිරීම

04. නොඇසූ දහම් කියා දීම

05. ඇසූ දහම් මනාව පැහැදිලි කර දීම

06. නිවනට මග කියා දීම

## සමාලෝචනය

මෙසේ සිගාලෝවාද සූත්‍රයේ සමස්ථ අන්තර්ගතයට අනුව එය පුද්ගලයාගේ සදාචාරාත්මක ගුණ වගාව සඳහා අවශ්‍ය මූලික දහම් උපදේශනය ලබා දෙන්නක් බව පැහැදිලිය. මානව සමාජයේ ඒ ඒ සමාජ කණ්ඩායම් තමන්ගෙන් ඉටුවිය යුතු යුතුකම් මනාව ඉටුකරන විට සාමකාමී සහ සහජීවනයෙන් යුක්ත සමාජයක් නිර්මාණය වනු ඇත. යුතුකම් හා අයිතිවාසිකම් පිළිබඳව සමාජයේ බොහෝ සේ සංවාදයට ලක්වන බැවින් මෙම සිගාලෝවාද සූත්‍රයේ එන ඇතැම් කරුණු වර්තමානයට ගැළපෙන ලෙස සකස් කර ගත යුතුය. එසේම මෙම ඉගැන්වීම් එදාටත්, අදටත්, හෙටටත් වලංගු සර්වකාලීන අගයකින් යුත් නිසා එම ඉගැන්වීම් සමස්ත සමාජයේ ප්‍රායෝගික වන්නේ නම් එය මානව සමාජයේ සුවපත්භාවය උදෙසාම ඉවහල් වනු ඇත. තවද බුදු දහමේ උගන්වන උක්ත කාරණා වලට අමතරව යුතුකම් හා අයිතිවාසිකම් පිළිබඳව සාකච්ඡා කිරීමට වෙනත් කිසිදු අවකාසයක් ඉතිරි වී නොමැති බවද සඳහන් කළ යුතුමය.

## ආශ්‍රිත ග්‍රන්ථ

අංගුත්තරනිකාය, ඒකාදස නිපාත, මෙත්තානිසංස සූත්‍රය, (1976), බු.ජ.ත්‍රි ග්‍රන්ථමාලා, කොළඹ, 244 පිටුව.

ඛුද්දකනිකාය I, ධම්මපද දණ්ඩ වග්ගය, 2 ගාථාව, (1976), බු.ජ.ත්‍රි ග්‍රන්ථමාලා, කොළඹ, 56 පිටුව.

ඛුද්දකනිකාය I, ධම්මපද දණ්ඩ වග්ගය, 5 ගාථාව, (1976), බු.ජ.ත්‍රි ග්‍රන්ථමාලා, කොළඹ, 56 පිටුව.

ඛුද්දකනිකාය I, ධම්මපද දණ්ඩ වග්ගය, 1 ගාථාව, (1976), බු.ජ.ත්‍රි ග්‍රන්ථමාලා, කොළඹ, 56 පිටුව.

ඛුද්දකනිකාය I, ධම්මපද භික්ඛු වග්ගය, 2 ගාථාව, (1976), බු.ජ.ත්‍රි ග්‍රන්ථමාලා, කොළඹ, 144 පිටුව.

ඛුද්දකනිකාය I, ධම්මපද පණ්ඩිත වග්ගය, 3 ගාථාව, (1976), බු.ජ.ත්‍රි ග්‍රන්ථමාලා, කොළඹ, 42 පිටුව.

දීඝනිකාය III, පාථික වග්ගපාලි, සිගාලක සූත්‍රය, (1976), බු.ජ.ත්‍රි ග්‍රන්ථමාලා, කොළඹ.

මජ්ඣිමනිකාය III, බාල පණ්ඩිත සූත්‍රය, (1976), බු.ජ.ත්‍රි ග්‍රන්ථමාලා, කොළඹ, 360 පිටුව.

සුත්තනිපාතය, මංගල සූත්‍රය, (1976), බු.ජ.ත්‍රි ග්‍රන්ථමාලා, කොළඹ, 80 පිටුව.

සුත්තනිපාතය, වසල සූත්‍රය, (1976), බු.ජ.ත්‍රි ග්‍රන්ථමාලා, කොළඹ, 40 පිටුව.

සුත්තනිපාතය, පරාභව සූත්‍රය, (1976), බු.ජ.ත්‍රි ග්‍රන්ථමාලා, කොළඹ, 32 පිටුව.

ජාතක පොත් වහන්සේ, කුරු ධර්ම ජාතකය, (2000), බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය, දෙහිවල, 280 - 284 පිටු.

වෙසක් හඬ, වාර්ෂික ධර්ම සංග්‍රහය, (2006), 105 -117 පිටු.

ගිරිහිස, ජ්‍යෙෂ්ඨ මහාචාර්ය, පූජ්‍ය කන්දේගොඩ විමලධම්ම අනුනාහිමි සේවාභිනන්දන ශාස්ත්‍රීය සංග්‍රහය, (2010), 251 -258 පිටු.

Bhikkhu Ñānamoli, (2000) The Life of the Buddha, Buddhist Publication Society. Kandy, Sri Lanka.

Robet, R.H, Mitchell, E, and Kusy, R.J, (2013). Development of Human Resources, part I, Beyond Training a Perspective on Improving Organizations and People in the Paper Industry.

Wilson, J.D (2014), Human Resource Development, European Journal of Training and Development. 254-258 p.